


නිකිනි උදානි දිසානායක

කතෘගේ නම

# ලීසාට ලැබුනු හා පැටියා

**නිකිනි උදානි දිසානායක**

**කතෘගේ නම**

**මහමායා බාලිකා විදුහල**

**7 A පංතිය**

ISBN 37789

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එක මත් එක කාලෙක ලස්සන ගමක්

තිබුනා ඒ ගමේ අම්මයි,තාත්තයි පුංචි

ළමයෙකුයි ජීවත් වුණා. ඒයා ගේ නම

ලීසා ඒයා හරිම කරැණාවන්ත

කෙනෙක්,ඒ වගේම සතුන්ට ගොඩාක්

ආදරේ කෙනෙක් .........

ලීසා හාවන්ට ගොඩක් ආදරේයි........ ඒ නිසා ඒයා ඒයාගේ කාමරේ හැම තැනම හාවන්ගේ පින්තූර ඇඳලා එල්ලා තිබුනා...... ඒයා ඇත්තම හා පැටියෙක් ඒයාට ලබා ගන්න ආසාවෙන් හිටියා......



ලිසා ඉතින් එක දවසක් අම්මා ලගට ගිහින්

මෙහෙම ඇහුවා.. අම්මේ මම හොද ළමයෙක් ද

එතකොට අම්මා කිව්වා ඔයා ගොඩක් හොද



ළමයෙක් ඇයි ඔයා

එහෙම අහන්නේ නැ

අම්මේ හොද ළමයින් ට නේ දෙවල් හම්බ

වෙන්නේ එකයි.... ඔව් පුතේ ඔයා ගොඩක් සතුන්ට

අදාරේ කරනවා හොදට ඉගෙන ගන්නවා.... එක නිසා

ඔයා ඉල්ලන දෙවල් ඔයාට ලැබේනවා......



ඔන්න ඉතින් එක දවසක් එයාගේ අම්මයි

තාත්තයි තිරණය කලා ගමේ ඇවිදින්න යන්න

මොකද ලීසා කැමති ගමේ ඇවිදින්න යන්න

එයා ගමේ ඇවිදින්න යන්නේ සත්තු එක්ක

කාලය ගත කරන්න



ඔන්න ඉතින් ඊළඟ දවසේ පවුලේ හැම දෙනාම අවශ්‍ය

බඩු රැගෙන ගමේ ඇවිදින්න පිටත් වුනා.... ලීසා සතුටින්

කෑ ගැහැව්වා..



ඔන්න ඉතින් ටික දුරක් ගිහින් ටික වෙලාවක්

ඉදගෙන ඉදලා ආයෙත් ගමන ආරම්භ කලා එතකොට

ලිසා දැක්කා පොඩි ගුලක් තියෙනවා ඉතින් ලිසා පුංචි

කොටු කැල්ලක් ගුල ඇතුලට දැම්මා...



එතකොට එක ඇතුලේ ඉදලා ලස්සන හා පැටියෙක්

එළියට ආවා.... ලිසා පුදුම උනා .... ඊට පස්සේ ලීසා හා



අම්මයි තාත්තයි හා පැටියව අරගෙන ගෙදර

ගියා....එදා ඉදලා ලිසා හා පැටියව බලා ගත්තා......



# ලීසාට ලැබුණු හා පැටියා







# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණාකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්